ප්‍රවෘත්ති වාර්තාවන් පළ කිරීමේදී මූලාශ්‍රයන් හෙළිකිරීමට මූලාශ්‍රයෙන් අවසර නොලැබෙන අවස්ථාවකදී හැරෙන්නට මූලාශ්‍රයන් පළ කරනා ලෙසින් මාධ්‍යවේදීන්ව දිරිමත් කෙරෙන්නේත්, හැකිතාක් දුරට බහු මූලාශ්‍රයන් පරිශීලනය කරන මෙන් පැවසෙන්නේත්, පුවත් වාර්තාවේ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා වේ. එසේම මූලාශ්‍ර නොදක්වා සිතා මතාම අසත්‍ය හා නොමග යවන සුළු කරුණු ඉදිරිපත් කිරීමටද හැකියාවක් තිබීම නිසාද, මූලාශ්‍රයන් සඳහන් කිරීමේ වැදගත්කම අවධාරණය වේ.

කෙසේ නමුත් මෙය නොසළකා හැර පළ කරනා පුවත් වාර්තාවන් අපට දක්නට ලැබීම කණගාටුවට කරුණකි. ඊට උදාහරණ ලෙසින් දිවයින පුවත්පතේ පළවූ පහත ප්‍රවෘත්තිය දැක්විය හැක. මේ තුළ ඉදිරිපත් කොට ඇති එකදු කාරණාවක් සඳහා හෝ මූලාශ්‍ර සපයා නැත. ඒ ඔස්සේ මෙම සපයා ඇති කරුණු කෙතරම් දුරට නිවැරදි දැයි පාඨකයන් තුළ සැකශංකා පහළ වීම වැළැක්විය නොහැක.

උදාහරණ ලෙසින්, මෙහි ඇති සැබවින්ම නිරවද්‍ය කරුණු දැයි ගැටළුකාරී වන තැන් දෙකක් පෙන්වා දෙමු. පළමුව, ස්වාධීන කොමිසමක සාමාජිකයෙකු ලෙස ද්විත්ව පුරවැසියෙකුට කටයුතු කිරීමට හැකියාවක් ව්‍යවස්ථානුකූලව නැතැයි මෙම පුවත් වාර්තාව පවසයි. මෙම කරුණ ඉදිරිපත් කෙරෙන්නේ කුමන මූලාශ්‍ර පදනම් කරගනිමින්ද? ඒ සම්බන්ධයෙන් විමසීම සඳහා අප මහාචාර්ය හූල්ව සම්බන්ධ කරගත් විට ඔහු සඳහන් කර සිටියේ, ශ්‍රී ලංකා ව්‍යවස්ථාවට අනුව ද්විත්ව පුරවැසියෙකුට ස්වාධීන කොමිසමක සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට කිසිදු බාධාවක් නොමැති බවයි. දෙවෙනුව, හූල් නයිජීරියානු පුරවැසියෙකු බව පුවත් වාර්තාව පවසයි. ඒ සම්බන්ධයෙන් මහාචාර්ය හූල් ස්ථිර කරන ලද්දේ තමන්ට නයිජීරියානු පුරවැසිභාවයක් නොමැති බවයි.

මෙසේ ගත් විට, මූලාශ්‍රයන් නොමැතිව, නිරවද්‍ය නොවූ කරුණු ඉදිරිපත් කිරීමෙන් දිවයින විසින් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කොට තිබෙනවා නොවේද? වගකීම් සහගත මාධ්‍යකරණය මෙයද?

https://www.facebook.com/ethicseye/videos/636156570574919/

#MediaEthics #lka #SinhalaPress #Divaina